# අලෙවි අංශය

**ඊ.යූ.ඩබ්. උඩවත්ත**
**සහකාර අධ්‍යක්ෂ**
**අලෙවි අංශය**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවා, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට සැපයීමේදී විශේෂිත වූ කාර්ය භාරයක් අලෙවි අංශය මගින් ඉටුකරනු ලබයි. විශේෂයෙන් ගෝලීයකරණය වූ දේශීය ආර්ථිකයේ අතරමංවූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා මගපෙන්වීම, උපදෙස් දීම සහ සහායවීම මෙම අංශයෙන් කෙරෙන කාර්යභාරයයි. අද වෙළඳපොළෙහි තිබෙන තරඟකාරීත්වය නිසාම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවෝ තම නිෂ්පාදන අලෙවිකර ගැනීමේදී සහ වෙළඳපොළ කළමනාකරණය කරගැනීමේදී විවිධ ගැටළුවලට මුහුණපාති.

ව්‍යාපාරයක අනාගත පැවැත්ම රඳාපවතින්නේ එහි වෙළඳපොළ තත්ත්වය උඩයි. එනිසා සාර්ථකව වෙළඳපොළ හසුරුවා ගැනීමට අලෙවි අංශයෙන් ලැබෙන සහාය නිසාම එය සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන අංශයකි.

> **ගෝලීයකරණය වූ දේශීය ආර්ථිකයේ අතරමංවූ සුළු සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවනට තම නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා මඟපෙන්වීම, උපදෙස් දීම සහ සහායවීම අලෙවි අංශයේ කාර්යභාරයයි.**

වෙළඳපොළ අවස්ථා හඳුනාගැනීම හා වැඩිදියුණු කරගැනීම සඳහා සහායවීම තුළින් දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වර්තමාන තරඟකාරී වෙළඳපොළට මුහුණදිය හැකි සාර්ථක ව්‍යාපාර බවට පත් කිරීම හා දේශීය ආර්ථිකයේ මූලික කොටස්කරුවන් බවට පත් කිරීම අලෙවි අංශයේ අරමුණයි.

## අලෙවි අංශයෙන් සැපයෙන සේවා

සුළු හා මධ්‍යපරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ අලෙවි ගැටළු විසඳා ගැනීම සඳහා අලෙවි අංශයෙන් පහත සඳහන් සේවා සැපයේ.

- උපදේශක සේවා
- අලෙවි කළමනාකරණ හා ඇසුරුම්කරණ පුහුණුව
- වෙළඳපොළ අධ්‍යයන / අලෙවි සැළසුම් පිළියෙල කිරීම
- වෙළඳපොළ දත්ත සටහන් පිළියෙල කිරීම
- අලෙවි ප්‍රදර්ශන සංවිධානය
- වෙළඳපොළ තොරතුරු
- අතුරු කොන්ත්‍රාත් පහසුකම්
- ප්‍රදර්ශන පහසුකම් සහ අලෙවි කවුළු
- ගැණුම්කරු සැපයුම්කරු මුණගැස්වීම
- අමුද්‍රව්‍ය ලෙස අබලි දුනුකොල, ඇලුමිනියම්, තඹ, පිත්තල හා වානේ ලබාදීම
- කර්මාන්තකරුවන් විදේශ වෙළඳපොළට යොමු කිරීම

## මෙම සේවා සැපයීම

- උපදේශක සේවා, කළමනාකරණ සංවර්ධනය සහ සල්පිල්, ප්‍රදර්ශන සංවිධානය
- අතුරු කොන්ත්‍රාත් හුවමාරු ඒකකය
- භාණ්ඩ ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සැපයීම
- ලුහු ඉංජිනේරු කර්මාන්තකරුවනට ඇළුමිනියම්, තඹ, පිත්තල, යකඩ, වැනි අමුද්‍රව්‍ය ලබාදීම

යන අංශ හතර යටතේ ක්‍රියාත්මක වේ.

## උපදේශක සේවා, කළමනාකරණ සංවර්ධනය හා සල්පිල ප්‍රදර්ශන සංවිධානය

මේ යටතේ අලෙවි අංශයේ සාමාන්‍ය වැඩසටහන් ලෙස අලෙවි උපදෙස් සේවා, සැපයීම අලෙවි කළමනාකරණ වැඩසටහන් සහ පුහුණු කිරීම, අලෙවි අධ්‍යයන හා වාර්තා සැපයීම, අලෙවි දත්ත පත්‍රිකා සැකසීම, සාමාන්‍ය වෙළඳපොළ තොරතුරු සැපයීම, සැපයුම්කරුවන්, ගැණුම්කරුවන් මුණගැස්වීම, ඇසුරුම්කරණ සහ භාණ්ඩවල තත්ත්වයව සුරැකීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, විදේශ වෙළඳපොළ අවස්ථා හඳුනා ගැනීමට සහාය වීම, වෙළඳපොළ ප්‍රදර්ශන, සල්පිල් සංවිධානය හා ඒ තුළින් අලෙවිය වර්ධනය කරගැනීමට සහාය වීම ආදී කටයුතු වලින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහාය දක්වයි.

## අතුරුකොන්ත්‍රාත් හුවමාරු ඒකකය

අතුරු කොන්ත්‍රාත් හුවමාරු ඒකකය යනු මහා පරිමාණ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන සඳහා අවශ්‍ය අතුරු නිෂ්පාදන සුළු පරිමාණ නිෂ්පාදකයින්ගෙන් ලබාගැනීම සඳහා තිබෙන්නාවූ හුවමාරු මධ්‍යස්ථානයයි. සුළු පරිමාණ නිෂ්පාදකයා සපයන භාණ්ඩය ඔහුගේ අවසන් නිෂ්පාදනය වුවද එය භාවිතාකර මහා පරිමාණ නිෂ්පාදකයා වෙනස් නිමි භාණ්ඩයක් නිපදවනු ලබයි. මෙම ක්‍රමය විශේෂයෙන් කුඩා පරිමාණ කර්මාන්තවල පැවැත්මට බෙහෙවින් උපකාරී වෙයි. මෙම තත්ත්වයන් ජපානය වැනි දියුණු රටවලද ක්‍රියාත්මකවන ක්‍රමයකි. මෙම තත්ත්වය හඳුනාගත් ශ්‍රී ලංකා රජය ලෝක බැංකුවේ සහාය යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයට අනුබද්ධව 1980 දී අතුරු කොන්ත්‍රාත්

ඒකකය පිහිටුවනු ලැබීය. එය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පැවතීම නිසා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහායවීමට මහත් අත්වැලක් වී පවතී.

### අතුරු කොන්ත්‍රාත් හුවමාරු ඒකකයේ කාර්යයන්

- අතුරු කොන්ත්‍රාත් හුවමාරු ඒකකය යටතේ සහාය ලබාදිය හැකි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට තොරතුරු සැපයීම හා සහායවීම
- රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, හරහා අතුරුකොන්ත්‍රාත් හා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවනට තොරතුරු සැපයීම හා සහාය වීම
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති අතුරු කොන්ත්‍රාත් අවස්ථා පිළිබඳව රාජ්‍ය ආයතන මෙන්ම පෞද්ගලික ආයතන දැනුවත් කිරීම
- අතුරු කොන්ත්‍රාත් සැපයුම්/ගැණුම් ඇති කරගැනීම සඳහා සම්බන්ධතා ගොඩනැගීම
- පසුවිපරම් කිරීම සහ ප්‍රගති සමාලෝචනය කිරීම

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අතුරු කොන්ත්‍රාත් ඒකකය අනුගමනය කරන ක්‍රියා පිළිවෙත් වේ.

රාජ්‍ය පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල සැපයුම්කරුවෙක් ලෙස අතුරු කොන්ත්‍රාත් ඒකකයේ ලියාපදිංචි වීම

සැපයුම්කරුවන් ලෙස සුදුසු සුළු හා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් ලියාපදිංචි කර ගැනීම

අවශ්‍ය පිරිවිතර සහ භාණ්ඩ පිළිබඳ විස්තර ගැණුම්කරුවන්ගෙන් ලබාගැනීම

අවශ්‍යතා විශ්ලේෂණ සහ තොරතුරු අනුව වියදම් ඇස්තමේන්තු කිරීම

ලියාපදිංචි සැපයුම් (අතුරු කොන්ත්‍රාත්කරුවන්ගෙන් සුදුසු අය හඳුනාගැනීම සහ අවසන් මිළ පිළිබඳ නිරණය කිරීම)

ගැණුම්කරුට මිළ ගණන් සහ සාම්පල් ඉදිරිපත් කිරීම සහ ඒකගතාවයකට පැමිණීම

ඇණවුම් ලබාගැනීම

ලියාපදිංචි අතුරු කොන්ත්‍රාත්කරුවන් අතර ඇණවුම් බෙදාහැරීම

පසුවිපරම් කිරීම සහ තත්ත්ව පරීක්ෂාව

නියමිත වේලාවට සහ ස්ථානයට නිමි ද්‍රව්‍ය යැවීම

ඇණවුම්කරුගෙන් ගෙවීම් ලබා ගැනීම

අතුරු කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම

දැනට අතුරු කොන්ත්‍රාත් ඒකකයේ සැපයුම්කරුවන් ලෙස ක්ෂේත්‍ර කීපයක කර්මාන්තකරුවන් ලියාපදිංචි වී ඇත. අදාල ක්ෂේත්‍ර වන්නේ,

- දැව, වානේ, ෆයිබර් ග්ලාස්, ගෘහ භාණ්ඩ නිෂ්පාදන
- යන්ත්‍රෝපකරණ සහ අමතර කොටස්
- රබර් භාණ්ඩ නිෂ්පාදන
- කොහු සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
- සම් භාණ්ඩ නිෂ්පාදන

එමනිසා එම ක්ෂේත්‍රවලට අදාල භාණ්ඩ ඇණවුම්කරුවන් වෙත්නම් ඒ අයට අතුරු කොන්ත්‍රාත් හුවමාරු ඒකකය හරහා භාණ්ඩ ඇණුම් කිරීමට හැකියාව ඇත.

### භාණ්ඩ ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සැපයීම

අලෙවි අංශයෙන් ක්‍රියාත්මක නවත් සේවාවක් වන්නේ කර්මාන්තකරුවනට තම නිෂ්පාදන භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ පයසුකම් සැපයීම සහ එතුළින් ඇණවුම් ලබාගැනීමට ඉඩකඩ සැලසීමන්ය. එසේම ප්‍රදර්ශනාගාරයේ භාණ්ඩ අලෙවි කිරීම් පහසුකම්ද සපයා ඇත. මෙම පහසුකම් අලෙවි අංශය මගින් පාලනයවන කොළඹ සර් ජේම්ස් පීරිස් මාවත, අංක : 125, පිහිටි ලක් නිපැයුම් අලෙවි මධ්‍යස්ථානය මගින් සැපයේ.

එහි ප්‍රදර්ශනයට මෙන්ම අලෙවියටද භාණ්ඩ තබා ඇති අතර, එමගින් කර්මාන්තකරුවන්ට වෙළඳපොළට පිවිසීමට ඇණවුම් ලබා ගැනීමට ඉඩපහසුකම් සැළසේ. එසේම භාණ්ඩවල තත්ත්වය වර්ධනය කරගැනීමට හා භාණ්ඩවල ප්‍රමිතිය පිළිබඳ දැනගැනීමටත් පාරිභෝගික අවශ්‍යතා අනුව භාණ්ඩ සැපයීම පිළිබඳව

කර්මාන්තකරුවන් දැනුවත් වීමද ලක්නිපැයුම් මධ්‍යස්ථානය මගින් කර්මාන්තකරුවන්ට සිදුවන සේවාවකි.

මෙම මධ්‍යස්ථානයේ සේවාවන් පිළිබඳ විස්තර අලෙවි අංශය මගින් හෝ කළමණාකරු, ලක් නිපැයුම් මධ්‍යස්ථානය, අංක : 125, සර් ජේම්ස් පීරිස් මාවත, කොළඹ - 02. මගින් විමසා දැනගත හැකිය.

## අමුද්‍රව්‍ය ලෙස අබලි දුනුකොළ, ඇළුමිනියම්, තඹ, පිත්තල, ලැමිනේෂන් සහ තඹ කම්බි ලබාදීම

ලුහු ඉංජිනේරු කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සුළු හා මධ්‍යපරිමාණ කර්මාන්තකරුවන් මුහුණපා ඇති ප්‍රධාන ගැටළුවක් වන්නේ ආනයනික අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් නිෂ්පාදන වියදම ඉහළ යාමය. එමනිසා ආනයනික භාණ්ඩ සමග තරඟකාරී මිළකට භාණ්ඩ සැපයීමද ඔවුනට කළ නොහැකිය. මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් රජයේ නව ප්‍රතිපත්තිය යටතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් ඉවත් කෙරෙන අබලි ද්‍රව්‍ය අමුද්‍රව්‍ය ලෙස ලබා ගැනීමේ පහසුකම් අලෙවි අංශයේ අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය යටතේ සලසා ඇත.

***ඒ අනුව ලුහු ඉංජිනේරු සහ වාත්තු කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී ඇති කර්මාන්තකරුවන් සඳහා දුනුකොළ, ඇළුමිනියම්, තඹ, පිත්තල, ලැමිනේෂන්, තඹ කම්බි අමුද්‍රව්‍ය වශයෙන් අලෙවි අංශය මගින් සාධාරණ මිළට සපයනු ලබයි.***

මෙම ද්‍රව්‍ය කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලබා ගැනීමට අයදුම් පත්‍රයක් ඉදිරිපත්කර ලියාපදිංචි විය යුතු අතර, අවශ්‍යතා අනුව අමුද්‍රව්‍ය බෙදාහැරීම අලෙවි අංශය මගින් සිදු කෙරේ.

මේ සියළු පහසුකම් ලබාගැනීම පිළිබඳ වැඩිදුර විස්තර දුරකථන අංක : 2607003 මගින් විමසිය හැකිය. ලිඛිතව විමසන්නේ නම් අධ්‍යක්ෂ, අලෙවි අංශය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයෙන් විමසා දැනගත හැකිවේ.


**කාර්මික සංවර්ධන මණ්ඩලීය ප්‍රකාශන**

### අපනයනය සඳහා කොහුබත් කුට්ටි සහ පොල්ලෙලි කැබලි නිෂ්පාදනය

*අන්තර්ගතය*

- The availability & the quality assurance of coir fibre pith
- කොහුබත් කුට්ටි නිෂ්පාදනය
- කොහුබත් සහ පොල්ලෙලි අපනයනයේදී උපයෝගී කරගනු ලබන නිෂ්පාදන ප්‍රමිතීන් හා ගුණාංග
- ප්‍රමිති සහ පිරිවිතර
- කොහුබත් අපනයනයට අදාල තත්ත්ව පාලනය
- තත්ත්ව පරීක්ෂණය
- Test methods for coir dust
- Divers utilization Techniques of coir fibre dust in soil-less cultivation in Europe
- Development of coconut fibre dust low density briquettes
- ඇසුරුම්කරණය: විශේෂයෙන් කොහුබත් සඳහා
- කොහුබත් ආශ්‍රිත භාණ්ඩ අලෙවිකරණය
- අපනයනය සඳහා කොහුබත් නිෂ්පාදනය හා පොල්ලෙලි කැබලි
- අපනයන වෙළඳපොලට පිවිසීම
- Marketing more than just selling
- කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන හා එහි පාරිසරික බලපෑම්
- යන්ත්‍ර සහ උපකරණ
- ඇසුරුම් උපකරණ
- Briquetting bio-waste the Ameteep way
  Coir pith & its significance

පිටපතක මිළ රු. 500/-